| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** | **DSD/HO/MF/05/01/**<br>චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | ........................................ | දිනය<br>திகதி<br>**Date** | **2017.07.27** |

සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක : 2017/10

සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු කළමණාකරු / ප්‍රජාමුල බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමුල බැංකු / බැංකු සමිති මඟින් නිකුත් කරන ණය සඳහා වාර්ෂික පොළී අනුපාත සංශෝධනය කිරිම</u>**

01. සමෘද්ධි බැංකු / බැංකු සමිති මඟින්, දැනට ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම වල වාර්ෂික ණය පොලී අනුපාතයන් 2017.08.01 දින සිට ඉහල නැංවිමට කළමණාකරන මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත.

02. සමෘද්ධි බැංකු මඟින් ක්‍රියාත්මක ගෘහ ඒකක යටිතල පහසුකම් ණය යෝජනා ක්‍රමය හා සමෘද්ධි බැංකු සමිති හරහා ක්‍රියාත්මක දිවිනැගුම ඉසුරු ණය වැඩසටහන යටතේ 2017.08.01 දින සිට නිකුත් කරන නව ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය 14% දක්වා ඉහල නංවනු ලබයි.

03. ඉහත ඡේද අංක 02හි සඳහන් ණය යෝජනා ක්‍රම හැර සමෘද්ධි ප්‍රජාමුල බැංකු මඟින් ක්‍රියාත්මක අනිකුත් ණය යෝජනා ක්‍රම යටතේ 2017.08.01 දින සිට ලබාදෙන නව ණය මුදල් සඳහා බලපවත්වන වාර්ෂික පොලී අනුපාතය 12% දක්වා සංශෝධනය කරනු ලබයි.

04. 2017.07.31 දිනට පෙර නිකුත් කර ඇති, දැනට පිටහිටි (කල්පසුවූ ණයද ඇතුලත්) ණය මුදල් ද, අත්හිටුවා හෝ අවලංගු කර ඇති ණය යෝජනා ක්‍රම යටතේ, ලබා දී දැනට පිටහිටි ණය මුදල්හි ගිවිසුම් ගත පොලී අනුපාතයන් නොවෙනස්ව තවදුරටත් බල පැවැත්වේ.

05. මෙම චක්‍රලේඛ උපදෙස් අනුව, වාර්ෂික පොලී අනුපාත සංශෝධනය කිරිමට පෙර, පාලක / විධායක කමිටු මඟින් අනුමත කර ඇති, නමුත් 2017.08.01 දිනට පසු නිකුත් කරන ණය සඳහා නව පොලී අනුපාත වලංගු වේ.

06. ජීවනෝපාය සංවර්ධන චක්‍රිය ණය යෝජනා ක්‍රමය හා ස්වශක්ති ණය වැඩසටහන්වල දැනට බල පවත්වන පොලී අනුපාත වල කිසිදු වෙනසක් ඇති නොවේ.

07. සමෘද්ධි බැංකු / බැංකු සමිති මඟින් දැනට ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම සඳහා බලපවත්වන අනිකුත් උපදෙස් නොවෙනස්වන බව තවදුරටත් දන්වමි.

**නීල් බණ්ඩාර හපුහින්න,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

**පිටපත් :-** 01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය - කා.දැ.ස.

02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.

03. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ස.

04. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දැ.ස.

05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ස.